01. වසමේ නම :- 787 වලල්ලාවිට නැගෙනහිර

02. හැඳින්වීම

2:1 පිහිටීම :-

පළාත	-	බස්නාහිර
දිස්ත්‍රික්කය	-	කළුතර
මැතිවරණ කොට්ඨාසය (ආසනය)	-	අගලවත්ත
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	-	වලල්ලාවිට
පළාත් පාලන ආයතනය	-	වලල්ලාවිට ප්‍රාදේශීය සභාව
ග්‍රාම නිලධාරී කොට්ඨාසය	-	වලල්ලාවිට නැගෙනහිර
ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය	-	787

මායිම් :-

උතුරු	-	788 බී මගුරුමස්විල
දකුණු	-	787 බී වලල්ලාවිට දකුණ
නැගෙනහිර	-	850 ඊ පැලවත්ත බටහිර දකුණ
බටහිර	-	787 ඒ කටුදොර / 787 සී තොටහා

2:2. දේශගුණය හා භූ විෂමතා ලක්ෂණ

නිරිතදිග මෝසම් සුළං හරහා සක්‍රීය වර්ෂා කාලය ක්‍රියාත්මක වුවද ප්‍රාදේශීය වශයෙන් පවතින භෞතික සාධක පසනම් කරගෙන වර්ෂය පුරා පැතිරුණ වර්ෂාපතන රටාවක් දක්නට ලැබේ.මධ්‍යවාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 4000ක් පමණ වන අතර සාමාන්‍ය උෂ්ණත්වය සෙල්ෂියස් අංශක 27ක් පමණ වේ.වාර්ෂික වැඩිම උෂ්ණත්වය ජූලි - අගෝස්තු මාස වල වර්තා වන අතර අඩුම උෂ්ණත්වය දෙසැම්බර් මාසයෙන් වාර්තා වේ.

ප්‍රධාන භූවිෂමතා ලක්ෂණය ලෙස දක්නට ඇත්තේ රැළිබිම් ලක්ෂණයයි.ඒ අනුව භූමියේ තැනිතලා හා උස්බිම් වලට අමතරව වගුරුබිම් බහුලව දක්නට ඇත.කෘෂිකාර්මික කටයුතු සඳහා වඩාත් සුදුසු සාරවත් පසක් ඇති අතර රබර් වගාවට විශේෂිත ලැටරයිට් මිශ්‍ර රතු කහ පොඩ්සොලික් පාංශු කණ්ඩය දක්නට ලැබේ.

2:3 සමාජ හා ආර්ථික තත්වය

ග්‍රාමීය හා අර්ධ නාගරික සමාජ රටාවන් වල සම්මිශ්‍රණයක් මෙම වසම තුළ දක්නට ලැබේ.ප්‍රධාන පරිපාලන ආයතනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වසම මධ්‍යයේ පිහිටා තිබීම හේතුවෙන් ඒ අවට ප්‍රදේශයේ අර්ධ නාගරික ලක්ෂණ දක්නට ලැබෙන අතර අනෙකුත් ප්‍රදේශ ග්‍රාමීය ලක්ෂණ පෙන්නුම් කරයි.අර්ධ නාගරික ජනතාවගේ ප්‍රධාන ඉපැයීම් මාර්ගය වෙළඳාම හා සේවා සැපයීම වන අතර ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ඉපැයීම් මාර්ගය කෘෂිකර්මාන්තය වේ.ඒ අනුව මෙම වසම තුළ ඇත්තේ මිශ්‍ර ආර්ථික රටාවකි.

2:4 සංස්කෘතික ලක්ෂණ

වසමේ ජනගහනය තුළ මිශ්‍ර ජාතීන් නොවන බැවින් මෙහි දක්නට ලැබෙන්නේ සිංහල බෞද්ධ සංස්කෘතික ලක්ෂණයන්ය.නමුත් ප්‍රාදේශීය වශයෙන් විශේෂිත වූ සංස්කෘතික ලක්ෂණ පවතී.දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයට මායිම්ව පිහිටා තිබීම නිසාම,භාෂා ව්‍යවහාර,ආහාර රටා,ඇඳහිලි හා විශ්වාස,සිරිත් විරිත් හා නර්තන සම්ප්‍රදාය යන අංශ වල දකුණු පළාතට ආවේණික සංස්කෘතික ලක්ෂණ වල යම් බලපෑමක් දක්නට ලැබේ.

2:5 යටිතල පහසුකම් සංවර්ධනය

කොට්ඨාශයේ අනෙකුත් වසම් හා සැසඳීමේදී යටිතල පහසුකම් වල අවශ්‍යතාවය අවම මට්ටමක පවතින වසමක් ලෙස මෙම වසම හැඳින්විය හැක.නමුත් සමස්ත වසම තුළ යටිතල පහසුකම් සංවර්ධනය ගත් කල අර්ධ නාගරික ප්‍රදේශයට පමණක් මෙම යටිතල පහසුකම් සීමා වීමක් දක්නට ලැබේ.

03. වසමේ නම සෑදුන ආකාරය

වලල්ලාවිට යනුවෙන් හඳුන්වන ප්‍රදේශයට 787 වලල්ලාවිට නැගෙනහිර හා 787 ඒ වලල්ලාවිට දකුණ යන වසම් දෙකම අයත් වේ.වලල්ලාවිට යන ප්‍රදේශයට අක්කර ..... පමණ අයත් වේ.පරිපාලන දුෂ්කරතා අවම කර ගැනීම සඳහා මෙම මුළු භූමි ප්‍රමාණය අද ග්‍රාම නිලධාරී වසම් දෙකක් ලෙසට වෙන් කර ඇත.


වලල්ලාවිටට අයත් මෙම ප්‍රදේශයේ බටහිරට සීමාවට වන්නට ඇත්තේ තොටහා හා කටුදොර යන ග්‍රාම නිලධාරී වසම් ය.වලල්ලාවිට ප්‍රදේශයේ දක්නට ලැබෙන භූ විෂමත ලක්ෂණය වන්නේ තැනිතලා හා වගුරු බිම් ය.නමුත් බටහිරට වන්නට කටුදොර හා තොටහා ග්‍රාම නිලධාරී වසම් කඳු සහිත ප්‍රදේශයක් ලෙසට පිහිටා ඇත.මෙය උතුරේ සිට බටහිර දෙසට වලල්ලක් ආකාරයෙන් විහිදි ඇත.

මෙහි අනෙක් කොටස බෙන්තර ගඟේ අතු ගංඟාවක් වන පැලවතු ගඟට මායිම්ව පිහිටා ඇත.මෙම ගඟ ආශ්‍රිතව දක්නට ලැබෙන්නේ වගුරු බිම් ලක්ෂණයන්ය.මෙම වගුරු බිම් සහිත ප්‍රදේශයේ වළළු හැඩයේ ඕවිටි දක්නට ඇත.අතීතයේ මෙම වළළු හැඩයේ ඕවිටි බහුලව දක්නට ලැබුන බව ප්‍රදේශයේ වැඩිහිටියන් පවසයි.

ඒ අනුව කඳු වළල්ලකින් වටවූ වළළු හැඩැති ඕවිටි සහිත ප්‍රදේශය අතීතයේ හඳුන්වා ඇත්තේ වළළුඕවිට යන නමින්ය.නමුත් පසුකාලීනව මෙම වළළුඕවිට යන නම වලල්ලාවිට යනුවෙන් විකාශය වී ඇති බව ප්‍රදේශයේ වැඩිහිටියන් පවසයි.

04. වසමට පිවිසිය හැකි ගමන් මාර්ග

4:1 කළුතර සිට වලල්ලාවිට දක්වා :-



4:2 අළුත්ගම සිට වලල්ලාවිට දක්වා :-

